**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය - 2017**

**--------------------------------------------------------**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාව මණ්ඩලයේ සභාපති වෙත 2018 සැප්තැම්බර් 21 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

`

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24

-----------------------------------

ප්‍රමිතියේ 25 සහ 26 ඡේද අනුව ආශ්‍රිත සමාගම් සමඟ සිදු කරනු ලබන සියළුම ගනුදෙනු විස්තරාත්මකව හෙළිදරව් කළ යුතු වුවත් මණ්ඩලය එහි ආශ්‍රිත සමාගමක් වූ ඩිවලොප්මන්ට් හෝල්ඩින් පුද්ගලික සමාගමට ගෙවූ රු.617,818 ක් වූ ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සහ ඩිවලොප්මන්ට් හෝල්ඩින් පුද්ගලික සමාගම සමඟ එළඹි බදුකුලී ගිවිසුමට අනුව සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු රු.5,937,500 ක බදු කුලිය හා වාහන නැවැත්වීමේ කුලී රු.120,108 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) තිස්සමහාරාම අපනයන නිෂ්පාදන ගම්මාන සමාගමට ලබාදී තිබූ රු. 2,493,310 ක් වූ ණය මුදල සඳහා අයවිය යුතු රු. 2,793,599 ක පොලී ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් පුද්ගලික සමාගමක ආයෝජනය කර තිබූ කොටස්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු. 3,000,000 ක් වුවද මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් ඇමතු සභාපතිගේ අංක ඊඩීබී/ආර්ඩීඩී/ආර්1/එම්අයිඑස්/022 දරන හා 2017 ඔක්තෝබර් 31 දිනැති කපා හැරීමට ඉල්ලුම් කර තිබූ ලිපිය අනුව ආයෝජිත මුදල රු. 2,948,731 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) මණ්ඩලය විසින් පෞද්ගලික සමාගමක ආයෝජිත ප්‍රාග්ධනය ලෙස ලෙජරයේ රු.598,457 ක් දක්වා තිබුණ ද ආයෝජන අඩුකිරීම් වෙන්කිරීමේ ලේඛනයේ එය රු.3,598,457 ක් ලෙස දක්වා තිබීම නිසා රු.3,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

රත්මලාන ගබඩාවට අයත් රු.877,303 ක වටිනාකමින් යුතු බදු කුලී ගිවිසුම් සහ තක්සේරු වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) **රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ** | |
| (i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 4.2.6 ඡේදය | කාර්තුවක් අවසන් වී දින 30 ක් තුළ රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට කාර්තුමය කාර්යසාධන වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 5.2.5 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත අයවැය ලේඛනයේ පිටපතක් ඊළඟ වර්ෂය ආරම්භ වීමට දින 15කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (iii) 2016 දෙසැම්බර් 16 දිනැති අංක පීඊඩී 05/2016 චක්‍රලේඛයේ 4.3 වගන්තිය | සාමාන්‍ය පටිපාටියෙන් බැහැරව ප්‍රසාද දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා සමාගම සම්බන්ධයෙන් බැහැරව ගෙවා තිබූ රු.2,560,467ක ප්‍රසාද දීමනා සඳහා එසේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

මණ්ඩලය විසින් තම ප්‍රධාන කාර්යාලය පවත්වා ගැනීම සඳහා භාවිතා කරනු ලබන නවම් මාවතේ මහල් 5 කින් යුතු ගොඩනැගිල්ල සඳහා 2016 මාර්තු 15 දින සිට 2017 මාර්තු 14 දින දක්වා පුද්ගලික සමාගමක් සමඟ බදු කුලී ගිවිසුමකට එළඹ තිබූ අතර 2017 මාර්තු 15 සිට 2017 ඔක්තෝබර් 26 දක්වා ගිවිසුමකින් තොරව රු.37,150,685 ක් කුළී ගෙවා තිබුණි.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.20,282,474 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.45,773,906 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.66,056,380 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ ප්‍රදාන රු.11,806,660 කින් අඩුවීම මෙන්ම පරිපාලන වියදම් රු.34,209,711 කින් හා අපනයන සංවර්ධන වියදම් රු.19,343,743 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

`

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩව ශුද්ධ ලාභයක් ඇතිවී තිබූ අතර එය වාර්ෂිකව උච්චාවචනය වී සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ අලාභයක් වී තිබුණි.කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමේදී 2013 වර්ෂයේදී රු.287,157,318 ක් වූ දායකත්වය ඉන්පසු වර්ෂවලදී පිරිහී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී දායකත්වය රු.197,541,947 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සැලසුම් කිරීම් හා ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එක් එක් ක්‍රියාකාරකම් ආරම්භ කරන හා අවසන් කිරීමට අපේක්ෂිත කාල වකවානු සඳහන් ක්‍රියාකාරී සැලැස්මක් හා භෞතික ප්‍රමාණ දක්වා ඇති කාර්යසාධන වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා මණ්ඩලයේ ප්‍රගතිය සංසන්දනාත්මකව පරීක්ෂා කළ නොහැකි විය.

(ආ) අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අනුමත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර, අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය ඇතුළත් මානව සම්පත් සංවර්ධන සැලැස්ම මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ වැඩසටහන් 12 ක් ක්‍රියාත්මක කර හා සම්පූර්ණ නොකිරීම නිසා රු. 12,460,000 ක් උපයෝජනය නොවී පැවතුණි.

(ඈ) අයවැය ලේඛනයේ සඳහන් ක්‍රියාකාරකම් 10 වෙනුවෙන් රු. 24,400,000 ක් ප්‍රතිපාදනය කර තිබූ නමුත් එය ඉක්මවා රු.13,900,000 ක් වැය කර තිබුණි.

(ඉ) ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ participation at ICA congress -2017 සහ Co – organize jewels Talk conference යන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.900,000 ක් වැය කර තිබුණි.

(ඊ) 2016 වර්ෂයේදී සැලසුම් කළ නමුත් ක්‍රියාත්මක කර නොතිබූ රු. 8,900,000 ක් ප්‍රතිපාදිත වැඩසටහන් 11 ක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොමැති අතර සමාලෝචිත වර්ෂයේදී සැලසුම් කළත් ක්‍රියාත්මක නොකළ රු. 7,300,000 ක් වෙන් කළ වැඩසටහන් 09 ක් ඉදිරි වර්ෂයට ගෙන යන බවට කාර්යසාධන වාර්තාවේ සඳහන් කර තිබුණ ද 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඒවා ඇතුළත් කර නොතිබුණි.

(උ) මත්ස්‍ය නිෂ්පාදනය සම්බන්ධ ජාත්‍යන්තර ගැණුම්කරුවන් හඳුනාගැනීමේ අරමුණින් 2017 අප්‍රේල් 25 සිට 27 දක්වා බෙල්ජියම් හිදී පවත්වන ලද SEAFOOD EXPO GLOBAL වෙළඳ ප්‍රදර්ශනය සඳහා අයදුම් කරන ලෙස ඉල්ලමින් පලකර තිබූ දැන්වීමේ මණ්ඩලය විසින් අපනයනකරුවන්ට ලබාදෙන මූල්‍ය අනුග්‍රහය සඳහන් නොවීමෙන් ප්‍රදර්ශනයට අපනයනකරුවන් අයදුම්කිරීම පෙළඹ වීම අඩුවී තිබුණි. තවද මණ්ඩලය විසින් එක් වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා එක් සමාගමකට අවස්ථා 3 කදී පමණක් මූල්‍ය අනුග්‍රහයන් සැපයීම කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී මෙම ප්‍රදර්ශනයට සහභාගී වූ අපනයන සමාගම් 3 කට ඊට පෙර අවස්ථා 5 ක දීද තවත් අපනයන සමාගම් 2 කට අවස්ථා 4 ක දීද මූල්‍ය අනුග්‍රහය සපයා

`

තිබුණි. මෙම ප්‍රදර්ශනයට සහභාගී වී මූල්‍ය අනුග්‍රහය ලබාගෙන තිබුණු එක් සමාගමක් 2015 වර්ෂයෙන් පසු අපනයන සිදුකර නොතිබුණු අතර වෙළඳ ප්‍රදර්ශනයෙන් පසුවද අපනයන සිදුකර නොතිබුණි.

(ඌ) අන්තර්ජාතික වෙළඳපොළෙහි ශ්‍රී ලාංකීය රබර් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට 2017 ජනවාරි 19 දින සිට 21 දින දක්වා කාලය තුළ ඉන්දියාවෙහි පවත්වන ලද INDIA RUBBER EXPO වෙළඳ ප්‍රදර්ශනයට අපනයන කරුවන් තෝරාගැනීමේදී වැඩි අපනයන ආදායම් උපයන මූල්‍ය දුෂ්කරතාවයන් නොමැති සමාගම් සඳහා වැඩි ලකුණු ද අඩු අපනයන ආදායම් උපයන සමාගම් සඳහා අඩු ලකුණුද ලබා දී අපනයන ප්‍රවර්ධනය සඳහා මූල්‍යාධාර දීම සිදු කර තිබීමෙන් මූල්‍ය දුෂ්කරතා පවතින අපනයන කරුවන් නගා සිටුවීමේ හා දිරිදීමේ කාර්යය නිසියාකාරව සිදුකර නොතිබුණි.මෙම වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වූ අපනයනකරුවන් 6 දෙනාගෙන් අපනයනකරුවන් 3 දෙනෙකුම එකම සමූහයකට අයත් අපනයකරුවන් වූ අතර එම සමූහය වෙනුවෙන් මණ්ඩලය විසින් රු. 527,100 ක මූල්‍ය අනුග්‍රහයක් ලබා දී තිබුණි. මේ නිසා අනෙකුත් අපනයනකරුවන්ට ඇති අවස්ථා අහිමිකර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල පෞද්ගලික සමාගම් 35 ක සාමාන්‍ය කොටස් වල ආයෝජනය රු. 58,312,484 ක් හා සමාගම් 29 ක වරණීය කොටස් වල කළ ආයෝජනය රු.105,066,208 ක් ලෙස දක්වා තිබුණි. මෙම ආයෝජන වලින් එකතුව රු. 17,315,000 ක් ආයෝජනය කර තිබූ සමාගම් 3 ක් 2002, 2007 සහ 2009 යන වර්ෂ වලදී විසුරුවා හැර තිබූ අතර ඇවරකරු විසින් කොටස් වල ආයෝජිත මුදල් ආපසු ගෙවීමට වත්කම් නොමැති බව දක්වා තිබුණි. තවද සමාගම් ලියාපදිංචි නාම ලේඛනයෙන් කපා හැර තිබූ සමාගම් 25 ක ආයෝජනය කර තිබූ රු. 46,323,648 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මණ්ඩලය විසින් ආයෝජන කාලානුරූපව සමාලෝචනය කර ඇතිවිය හැකි ප්‍රාග්ධන අලාභ වලක්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කෘෂි අපනයන කලාප තුළ අපනයන අභිමුඛ කෘෂි ව්‍යාපෘති 50 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2009 වර්ෂයේදී සපයා දී තිබූ රු. මිලියන 500 ව්‍යාපෘතිය යටතේ හම්බන්තොට වීරවිල අක්කර 18 ක භූමි ප්‍රදේශයක එළවළු හා පළතුරු වගාව සඳහා පෞද්ගලික සමාගමක් සමඟ එක්ව ආරම්භ කළ කෘෂි ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) සමාගම වෙත 1998 ජනවාරි 01 දින සිට 2002 දෙසැම්බර් 24 දින දක්වා මණ්ඩලය විසින් රු. 2,493,310 ක මුදලක් ලබා දී තිබූ නමුත් 2018 ජූලි වන විටත් එම මුදල හා ඊට අදාළ පොළී අයකර ගෙන නොතිබූ අතර මණ්ඩලයේ සහ එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල එය ලැබිය යුතු/ගෙවිය යුතු ලෙස සටහන් කර නොතිබුණි.

(ii) 2009 නොවැම්බර් 27 දින දෙපාර්ශවය අතර එළඹි ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුදල රු. 8,000,000 ක් වූ අතර වසර 10 කින් අදියර 3 ක් යටතේ නිම කළ යුතු විය. එසේ වුවද පළමු අදියර සඳහා ප්‍රතිපාදිත මුදල රු. 3,857,360 ක් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් වෙත 2009 නොවැම්බර් 26 දින නිකුත් කර තිබුණද සමාගම විසින් ඉන් රු.2,043,890 ක මුදලක් මාස 9 ක කාලයක්, වැය නොකර නිෂ්ක්‍රීයව තබාගෙන තිබුණි.

`

(iii) මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ කෘෂි අපනයන කලාපයේ කුරුඳු, ඉඟුරු හා වැනිලා ආදී සුළු අපනයන භෝග ඉහළ ප්‍රමිතීන් යටතේ වැඩිදියුණු කර අපනයන වෙළඳාම කරා යොමු කිරීම වුවද අරමුණු වලට පටහැනි ලෙස රු. 1,400,000 ක් වැය කර අඹ පැල 2000 ක් මිළ දී ගෙන අක්කර 15 ක අඹ පැල 500 ක් පමණක් වගාකර ඉතිරි පැල 1,500 ගොවීන්ට බෙදා දී තිබුණි. තවද රු. 52,000 කට මිළදී ගෙන තිබූ කෙසෙල් පැල 1000 ක් ද නියගය නිසා විනාශ වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iv) අපනයන අභිමුඛ කෘෂි ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කළ මෙම ව්‍යාපෘතියෙන් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ඉපයූ රු. 7,793,864 ක මුළු ආදායමෙන් අපනයන ආදායම රු.2,338,160 ක් පමණි. තවද 2016 හා 2017 වර්ෂ වලදී අපනයනයන් සිදු කර නොතිබීමත්, අඹ පැල ලබාගත් ප්‍රතිලාභීන්ට දේශීය හා විදේශ වෙළඳපොළ අවස්ථා ලබාගැනීමට මණ්ඩලය සහය නොවීමත් නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(v) මෙම කෘෂි අපනයන කලාපය තුළ පළාත් මට්ටමින් කෘෂි නිෂ්පාදන එකතු කිරීම හා ඒවායේ අපනයන මට්ටම වර්ධනය කිරීමේ අරමුණින් සැකසීම හා ඇසුරුම් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීමට හා ඊට අවශ්‍ය ගෘහ භාණ්ඩ මිළදී ගැනීමට රු. 24,120,000 ක් මණ්ඩලය විසින් අනුමතර කර තිබූ අතර 2015 ජූලි 28 දින වන විට රු. 18,590,296 ක් වැය කර ඉදිකිරීම් සිදු කර තිබුණ ද 2018 වර්ෂය වන විටත් එම මධ්‍යස්ථානය තුළ කිසිදු ඇසුරුම් හෝ සැකසුම් කටයුත්තක් සිදු කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයකට විහිදෙන අපනයන අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා සහයෝගීතාවය දැක්වීමේ ව්‍යාපෘතිය පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ව්‍යාපෘතියට අදාළ අයදුම්පත් ඇගයීම 5 දෙනෙකුගෙන් යුතු ඇගයීම් කමිටුවකින් සිදුකළ යුතු වුවත් අවස්ථා 5 කදී අනුමත ප්‍රමාණයට වඩා අඩු සාමාජිකයන් පිරිසක් ඇගයීම් කටයුතු සිදු කර තිබුණි.

(ii) මාර්ගෝපදේශයට අනුව අයදුම්කරුවන් විසින් වැඩසටහනට අදාළ වියදම් ප්‍රතිපූර්ණයට පෙර යෝජිත සංවර්ධන වැඩසටහන මණ්ඩලයේ අනුමැතියට භාජනය කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) මණ්ඩලය විසින් වැඩසටහන් වලට අදාළ අපනයනකරුවන්ගේ වියදම් ප්‍රතිපූර්ණය කිරීමෙන් පසුව ඔවුන් විසින් සපුරාලිය යුතු කොන්දේසි හෝ අත්කරගත යුතු යැයි අපේක්ෂා කරන ප්‍රගතිය සම්බන්ධයෙන් ගිවිසුම්වලට එළඹ නොතිබුණු අතර ප්‍රගතිය ඇගයීම නිසි පරිදි සිදුකර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

සමාලෝචිත වර්ෂය තුළ දී පවත්වන ලද ප්‍රදර්ශන 3 ක් සඳහා අදාළ අපනයන කරුවන්ගෙන් අයකළ යුතු මුදලට වඩා එකතුව රු.2,676,342 ක් වැඩිපුර අයකර තිබුණු අතර එම මුදල් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ආකාරය පිළිබඳ තීරණයක් ගෙන නොතිබුණි.

## 4.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

-----------------------------------------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හා නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයකු රේඛීය අමාත්‍යාංශය වෙත පිළිවෙලින් 2017 මාර්තු 13 හා 2017 අගෝස්තු 30 දින වලදී මුදාහැර තිබුණු අතර එම නිලධාරීන්ගේ වැටුප් හා දීමනා වෙනුවෙන් රු.817,898 ක මුදලක් 2017 දෙසැම්බර් 31 වන විට මණ්ඩලය විසින් දරා තිබුණි.

`

(ආ) මණ්ඩලයට අයත් ඩබල් කැබ් රථයක් 2015 ඔක්තෝබර් 30 දින සිට 2017 දෙසැම්බර් 22 දින දක්වා රේබීය අමාත්‍යාංශයට මුදාහැර තිබූ අතර එම කාලපරිච්ඡේදය වෙනුවෙන් මණ්ඩලය විසින් රු. 128,515 ක මුදලක් අලුත්වැඩියා හා නඩත්තු වෙනුවෙන් වැය කර තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්යමණ්ඩලය 282 ක් වුවත් සත්‍ය කාර්යමණ්ඩලය 249 ක් වූයෙන් පුරප්පාඩු 36 ක් හා අතිරික්තතා 03 ක් පැවතුණි. මෙම පුරප්පාඩු නිසා මණ්ඩලයේ ප්‍රධාන අරමුණ ඉටුවන ආකාරයට අදාළවන තනතුරු හඳුනාගෙන එම තනතුරු පුරප්පාඩු පිරවීමට ක්‍රියාකර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත මණ්ඩලය විසින් සිය විෂය පථයට අනුව ළඟාකර ගත යුතු අරමුණු වශයෙන් තිරසර සංවර්ධන අරමුණු වන බලය පැවරීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර ගැනීම, තිරසාර කාර්මීකකරණය හා නව්‍යතා සඳහා දිරිගැන්වීම හඳුනාගෙන තිබුණ ද, එහි විෂය පථයට ගැනෙන අනෙකුත් අරමුණු වන තිරසාර මූල්‍ය සංවර්ධන සඳහා ගෝලීය සබඳතාව ශක්තිමත්ව ක්‍රියාවට නැංවීමෙහි අරමුණෙහි අඩංගු (17 වන අරමුණ) අපනයන සංවර්ධනය හා විදේශ වෙළඳාම නැංවීමේ ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ හෙයින් ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීම නිසා මණ්ඩලයේ වාර්ෂික සැලැස්මට එම කාර්යයන් ඇතුළත් කර අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයට අනුමත තනතුරු 5ක් පැවති අතර සමාලෝචිත වර්ෂය තුළ වාර්තා 15 ක් නිකුත් කර තිබුණි. ඉන් වාර්තා 2 ක් සඳහා කළමනාකාරීත්වය විසින් පිළිතුරු ලබාදී නොතිබුණි. තවද අපනයන ප්‍රවර්ධන නිලධාරී ලෙස බඳවා ගන්නා ලද නිලධාරිනියක් 2017 ජනවාරි 02 දින සිට අභ්‍යන්තර විගණන නිලධාරී ලෙස අනුයුක්ත කර තිබුණි.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පාලනය

#### 6.2.1 ප්‍රසම්පාදනයන්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.19(ආ) ඡේදය අනුව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද මණ්ඩලය විසින් 2017 වර්ෂය සඳහා පමණක් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි.

`

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2(ආ) ඡේදය පරිදි එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි ආරම්භක අවස්ථාවේ සිට අවසන් කරන තුරු පියවරයන් ක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාල සටහනක් මණ්ඩලය විසින් පිළියෙල කර නොතිබුණි.

(ඇ) Seafood Expo Global වෙළඳ ප්‍රදර්ශනයේ වෙළඳ කුටි ඉදිකිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතන 7 අතුරින් අඩුම මිලගණන ඉදිරිපත් කරන ලද ආයතනය වෙළඳ කුටියේ නිර්මාණාත්මක හැඩතළවල පැවති අඩුපාඩු සාකච්ඡා මට්ටමින් විසඳාගැනීමට හැකියාව තිබියදී එම මිල ප්‍රතික්ෂේප කර අවම මිලට වඩා යුරෝ 10,516ක් වැඩි අගයකට දෙවන අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනය තෝරාගෙන තිබුණි.

## 6.3 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

සමාලෝචිත වර්ෂයේ සංශෝධිත අයවැය හා සත්‍ය වියදම සංසන්දනයේදී අයිතම 3 ක සියයට 47 සිට සියයට 3400 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

පසුගිය විගණන වාර්තාවලින් පෙන්වා දී ඇති නමුත්, ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු විගණන ඡේද පහත දැක්වේ.

| වර්ෂය | ඡේද අංකය | විගණන ඡේදය |
|---|---|---|
| 2016 | 2.4 (ආ) | ගුවන් මගින් කරනු ලබන සියලුම ගමන් පිරිමැසුම් පන්තිය උපයෝගී කරගෙන යායුතු වුවත් මණ්ඩලයේ සභාපතිනිය හා විධායක අධ්‍යක්ෂ විසින් විදේශ සංචාර සඳහා ව්‍යාපාරික පන්තියේ ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම වෙනුවෙන් රු.1,886,350 ක් වැය කර තිබුණි. |
| | 2.4 (උ) | 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව මණ්ඩලයේ අවුරුදු 25 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබුණු සේවකයින්ට රන් පවුම් ලබා දීම සඳහා 2014 සිට 2016 වර්ෂය දක්වා රු.478,002 ක් වැය කර තිබුණද, සිය සේවකයින්ට ප්‍රතිලාභ ගෙවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන භාවිතා කිරීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| | 4.6 (ඇ) (ii) | සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2016 අගෝස්තු 21 දින පැවැත් වූ විභාගයේ ප්‍රතිඵල මත බාහිර අයදුම්කරුවන් 5 ක් හා අභ්‍යන්තර අයදුම්කරුවන් 4 ක් බඳවාගෙන තිබුණි. මෙම විභාගයේ ඉංග්‍රීසි විෂයය සඳහා ලබා දුන් කාලය ප්‍රමාණවත් නොවන බව සඳහන් කරමින් අභ්‍යන්තර අයදුම්කරුවන් කරන ලද ඉල්ලීමකට අනුව ඉංග්‍රීසි විෂයයට පමණක් නැවත විභාගය පවත්වා තිබුණි. |
| | 2.4 (අ) | සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකත්වය ගණනය කිරීමේදී විශේෂ දීමනා, වෘත්තීය දීමනා ,අන්තර් දීමනා හා අනුමත නොවූ විශේෂ ජීවන වියදම් දීමනා ඇතුළත් කිරීම හා ජීවන වියදම් දීමනාව ඇතුළත් නොකිරීම මත විගණනයට භාජනය වූ 2012 සිට 2015 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලට රු.5,508,199 ක් හා සේවක භාරකාර අරමුදලට රු.659,375 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| | 4.2 (අ) | කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා වැඩසටහන් සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරීමේදී නිසි තොරතුරු ඇතුළත් නොකිරීම හා කාලානුරූපව කටයුතු නොකිරීම නිසා අවස්ථා දෙකකදී එකම කරුණ සඳහා පුවත්පත් දැන්වීම් 2 ක් පළ කර තිබූ අතර,එහිදී පළමු පුවත්පත් දැන්වීම සඳහා වැය කළ රු.698,140 ක් අනාර්ථික වියදමක් වී තිබුණි. |
| | 4.3 | කුරුදු නිෂ්පාදකයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා පෞද්ගලික ආයතනයකට රු.26,373,010 ක් ගෙවා තිබුණි. මෙම මධ්‍යස්ථානය තුළින් අපනයන ප්‍රමාණයේ වර්ධනයට දායකත්වයක් 2017 ජූනි 28 දින වනවිටත් ලැබී නොමැති නිසා මෙම පුහුණු මධ්‍යස්ථානයට දරන ලද වියදම ඵලදායී වී නොතිබුණි. |
| 2015 | 2.3 (අ) | ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදලින් ලබා දුන් රු.5,000,000 ක් වූ ණය මුදලින් රු.2,891,748 ක් නිරවුල් කර නොතිබුණි. |
| | 2.4(අ) | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 23(I) වගන්තියට පටහැනිව පත් කර තිබූ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ සඳහා 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වැටුප් හා දීමනා ලෙස රු.4,076,773 ක්, රාජකාරි හා පෞද්ගලික ගමන් සඳහා ලබාදී තිබූ වාහනයේ කුළී ලෙස රු.6,270,670 ක් හා විදේශ ගමන් සඳහා දීමනා හා ගමන් ගාස්තු ලෙස රු.2,122,770 ක් වශයෙන් එකතුව රු.12,470,213 ක් විධිමත් අධිකාර බලයකින් තොරව ගෙවා තිබුණි. |
| | 2.5(අ) | 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 2 (1) අනුව ජනාධිපතිවරයාගේ සභාපතිත්වයෙන් හා වෙළඳ නැව් කටයුතු,කර්මාන්ත,කෘෂිකර්මාන්ත,ධීවර,මුදල්,විදේශ කටයුතු, ක්‍රම සම්පාදන සහ ග්‍රාමීය කර්මාන්ත යන විෂයන් භාර අමාත්‍යවරයන්ගෙන් සමන්විත ජාතික සංවර්ධන සභාවක් පිහිටුවිය යුතු අතර පනතේ 13 (1), (2) වගන්ති අනුව මණ්ඩලයේ බලතල,කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි හා ඉටුකිරීමෙහි ලා මණ්ඩලයට දරන්නට වන යම් වියදමක් පියවීම සඳහා අපනයන සංවර්ධන අරමුදලක් පිහිට විය යුතුය.<br><br>1992 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ වර්ෂ 23ක කාලපරිච්ඡේදය තුළදී අපනයන සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික සංවර්ධන සභාව රැස්වී නොතිබුණු අතර අපනයන සංවර්ධන අරමුදල ද පිහිටුවා නොතිබුණි. |
| | 2.5 (එ) (i) | 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව පසුගිය වසර 4 ක් තුළ වෘත්තීය දීමනාව රු.2,182,894 ක්, විශේෂ ජීවන වියදම් දීමනාව රු.18,284,887 ක් හා ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා රු.12,458,798 ක් වැය කර තිබුණි. |
| | 4.2(ආ) (iv) | අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව රු.5,040,000 ක මුදලක් එක්ස්පෝ ශ්‍රී ලංකා දිනය වෙනුවෙන් වෙන්කර තිබියදීත් මණ්ඩලයේ සභාපති සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් එම දිනය වෙනුවෙන් සහභාගී වීමට රු.1,079,688 ක් වැය කර තිබුණි. |
| | 4.2(ආ) (vi) | එක්ස්පෝ ප්‍රදර්ශනයට පත් කර තිබූ මණ්ඩලයේ නිලධාරීන්ට 2015 මැයි 15 දිනැති අංක MF01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04(ඩී) වගන්තියට පටහැනිව විදේශ ගමන් දීමනා සඳහා රු.3,770,640 ක් ගෙවා තිබුණි. |

`

| | | |
|---|---|---|
| | 4.2(ඇ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 25 වගන්තිය, 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව අනුමැතියකින් තොරව සේවක ණය අරමුදලක් පිහිටුවීමට හා ඊට මාසිකව සියයට 7.2 ක පොලියක් බැර කිරීමට 2015 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රදාන රු.2,567,531 ක් භාවිතා කර තිබුණි. |
| | 4.6 | 2015 වර්ෂයේ විගණන වාර්තාවෙන් හඳුනාගන්නා ලද පාඩු රු.1,918,314 ක් පෙන්වා දුන්නද ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| 2014 | 4.5 (ඇ) | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ බලතල හා කර්තව්‍යයන්ට පටහැනිව 2014 වර්ෂයේදී රු.2,520,848 ක වියදම් දරා තිබුණි. |
| | 2.5 (අ) (ii) | 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 12(ට) වගන්තිය අනුව මණ්ඩලය විසින් 1988 වර්ෂයේ සිට පෞද්ගලික සමාගම්වල කර තිබුණු රු.929,548,150 ක් වූ ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| | 4.9 | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයට අයත් වාහන 5 ක් සහ නිලධාරීන් 4 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ සේවයට යොදවා 2014 වර්ෂයේදී වාහන නඩත්තු වියදම්, කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස රු.2,824,256 ක් මණ්ඩලය විසින් දරා තිබුණි. |
| 2013 | 2.2.5 (ආ) | ජාතික සවිය වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙවිය යුතු ලෙස දක්වා තිබූ රු.1,009,740 ක් එම කාර්යාලයෙන් තහවුරු කර ගැනීමකින් තොරව සහ විධිමත් අනුමැතියකින් තොරව ආදායමට බැර කර තිබුණි. |
| | 4.2 (ඊ) | ඉන්දියාවේ චෙන්නායි නුවර 2004 සිට 2009 කාලපරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබූ ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳසැල් 5 කින් අය විය යුතු හිඟ කුළී හා විදුලි ගාස්තු රු.7,049,858 කින් රු.3,084,693 ක මුදලක් 2018 සැප්තැම්බර් 15 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. |

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | (i) මුදල් ආයෝජනය සම්බන්ධයෙන් නිසි අනුමැතිය ලබා නොගැනීම හා පසු විපරම් නොකිරීම.<br>(ii) අපනයන සමාගම් සමඟ ඇති කරගත් ගිවිසුම් පරිදි ණය හා පොලිය අය කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) විශේෂ ව්‍යාපෘති පාලනය | මණ්ඩලය විසින් ව්‍යාපෘති ආරම්භ කර ඉලක්කගත අරමුණු සපුරා ගැනීමකින් තොරව අතහැර දැමීම. |

`

| | | |
|---|---|---|
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවාගැනීමේ පටිපාටිය අනුව සේවයට බැඳී වසර 03 ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් විභාග නොපැවැත්වීම හා නියමිත විෂය කට්ටලය වෙනුවට එක් විෂයක් පමණක් විභාගයට ඇතුළත් කිරීම |